Article 12(1).

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date: 2019-02-08 |

පැමිණිලිකරු : කේ.කේ.ජේ.එස් ද අල්විස් මයා.
සත්ත්ව පාලන නිලධාරී.
ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලය.
සීප්පුකුලම.

වගඋත්තරකරුවන් :

01. වෛද්‍ය ටී.ජී.සී තිස්සකුමාර මයා.
අධ්‍යක්ෂ ජනරාල්.
සත්ත්ව නිශ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
පේරාදෙණිය.

02. අනුර රාජරත්න මයා.
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන).
සත්ත්ව නිශ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.
පේරාදෙණිය.

<u>පැමිණිලි අංකය</u> : **HRC/K/105/17**

පැමිණිල්ල :-

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා ශ්‍රී ලංකා සත්ත්ව නිශ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහකාර වරයෙකු ලෙස පශු වෛද්‍ය පර්යේෂණ ආයතනයේ වසර 22 ක් පමණ සේවය කරන බවත්, තමා දැනට සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයේ වසර 03 කට ආසන්න කාලයක් සේවය කරන බවත්, තමාගේ බිරිඳ කණ ආශ්‍රිත රෝගී තත්වයකින් පෙළෙන බැවින් හා තමාගේ දරුවන් පේරාදෙණිය අවට පාසල්වලට යන බැවින් බිරිඳ රැකියාවකට යාමත් දරුවන් පාසල් රැගෙන යාමත් ඒමත් තම බිරිඳ විසින් සිදුකරන බවත්, ඇයගේ රෝගී තත්වය අනුව ලබාදෙන ඖෂධ ලබාගැනීමෙන් පසු රිය පැදවීම සුදුසු නොවන බව වෛද්‍ය උපදෙස් ලබා දී ඇති අතර මෑතකදී දරුවන් පාසල් රැගෙන යාමේදී රිය අනතුරකටද මුහුණ පා ඇති බවත් තමාද දියවැඩියාව, අධි රුධිර පීඩනය වැනි

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk

රෝගී තත්වයන්ගෙන් පෙළෙන අයකු බැවින් ඒ සඳහා විශේෂ ආහාර ගතයුතු වුවත් තමා නිල නිවසේ සිටින බැවින් හදිසි රෝගී තත්වයකදී තමාට කිසිවෙකුගේ උදව් ලබා ගැනීමට හැකියාවක් නොමැති බවත්, තමා රාජකාරියට යාමේදී කඩුගන්නාවේ සිට සීප්පුකුලම යාමට හා ඒමට පැය 05 ක් පමණ ගතවන බැවින් මෙකී දුෂ්කරතා නිසා 2017.01.19 දින අභ්‍යන්තර ස්ථාන මාරුවක් සඳහා ඉල්ලීම් කළ බවත්ය. ඒ අනුව හිටපු අධ්‍යක්ෂ ජනරාල් තමාගේ ස්ථාන මාරුව පිළිගෙන එය අනුමත කර ඇති බවත් එකී ස්ථාන මාරුවේ අවශ්‍ය කටයුතු සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළද ඔහු අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝග නොසලකා හරිමින් අනුමත කර තිබූ ස්ථාන මාරුව ක්‍රියාත්මක නොකර එය ස්ථාන මාරු මණ්ඩලයට යොමුකළ යුතු බව පවසා සිටි බවත් සඳහන් කර ඇත.

නමුත් තමාගේ ස්ථාන මාරුව අනුමත කර තිබූ නිසාත්, එය අභ්‍යන්තර ස්ථාන මාරුවක් නිසා ස්ථාන මාරු මණ්ඩලයට ඉදිරිපත් කිරීම අනවශ්‍ය බව අධ්‍යක්ෂ ජනරාල්වරයා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැන්වූ බවත්, ඒ අනුව ස්ථාන මාරු ලිපිය සකස් කර තිබූ බවත්, අධ්‍යක්ෂ ජනරාල් විශ්‍රාම යාමට පෙර ඔහු විසින් ලබාදුන් ස්ථාන මාරුව නියමිත ලෙස ඔහුගේ අත්සනට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබූ බවත්, මේ සම්බන්ධයෙන් තමා විෂය භාර නිලධාරිනියගෙන් විමසූ විට එකී ලිපිය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) වෙත යැවූ බව දැනගන්නට ලැබුනු බවත්, තමා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු වූ විට ඔහු විසින් එම නියෝගය ක්‍රියාත්මක කළ නොහැකි බව තමාට දැන්වූ බවත් සඳහන් කර ඇත.

එසේම සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයේ සත්ත්ව පාලන නිලධාරිනියක ලෙස සේවය කළ නිලධාරිනියකට අභ්‍යන්තර ස්ථාන මාරුවක් ලබා දීමට එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරිය අනුමැතිය ලබා දී තිබූ බවත්, වසර 03 කට වැඩි කාලයක් සත්ත්ව පාලන විද්‍යාලයේ පශු වෛද්‍ය නිලධාරී තනතුරක් පුරප්පාඩුව පවතින අතර එම තනතුරේ අවශ්‍යතා සඳහා බාහිර දේශකයෙකු ලබාගන්නා බවත්, 2017 වසරේ වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කළද සුදුසු අනුප්‍රාප්තිකයෙකු නොමැති බැවින් තමාගේ ස්ථාන මාරුව නිර්දේශ නොකරන බව තමාට දන්වා ඇති බවත් සඳහන් කර ඇත.

මේ අනුව හිටපු අධ්‍යක්ෂවරයා විසින් අනුමත කර තිබූ තමාගේ ස්ථාන මාරුවීම ලබානොදීම නිසා තමා ඇතුළු පවුලේ සාමාජිකයින්ට විශාල අසාධාරණයක් සිදුව ඇති බවත් මේ සම්බන්ධයෙන් කරුණු සලකා බලා තමාගේ අනුමත කර තිබූ ස්ථාන මාරුව ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

වගඋත්තර පාර්ශවීය සැළකිරීම් :-

මෙම පැමිණිල්ලේ වගඋත්තර පාර්ශවීය අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙතින් වාර්තාවක් කැඳවා ඇති අතර එම වාර්තාවෙන් දක්වා ඇත්තේ, මෙම නිලධාරියා වාර්ෂික ස්ථාන මාරු සඳහා කරන ලද ඉල්ලීම ස්ථාන මාරු මණ්ඩලය විසින් නිර්දේශ කර නොමැත්තේ සුදුසු අනුප්‍රාප්තිකයෙකු නොමැති බැවින් වන බවත්, අදාළ නිලධාරියා 2017.01.19 දින අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද

ස්ථාන මාරු ඉල්ලීමට යොදා ඇති සටහනෙහි සඳහන් වන්නේද එම ඉල්ලීම කොන්දේසි 03 ක් මත අනුමත කරන බව මිස එකහෙලා අනුමත කරන බව නොවන බවත් ඒ අනුව එම කොන්දේසි සපුරන තෙක් අදාළ ස්ථාන මාරුව දිය නොහැකි බවත් දක්වා ඇත.

ඒ අනුව පළමු කොන්දේසිය වන පූර්ණ කාලීන දේශකයෙකු මෙම නිලධාරියා වෙනුවට යෙදවීමත්. පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන අනුප්‍රාප්තිකයා උතුරු මැද පළාත් සභාවේ පළාත් සභා සේවයේ සත්ත්ව පාලන නිලධාරියෙකු වන අතර ඔහුද එකඟතාවය පළ කරන්නේ වැඩ ආවරණය කිරීම සඳහා පමණක් බවත්. තවද පළාත් සභාවක නිලධාරියෙකු මධ්‍යම රජයේ ආයතනයක සේවයේ යෙදවීමට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මෙන්ම පළාත් ආණ්ඩුකාරවරයාගේද එකඟතාවය අවශ්‍ය වන බවත්, ඒ අනුව පළමු වන කොන්දේසිය සපුරාලීමට පැමිණිලිකරු අපොහොසත් බැවින් අදාළ ස්ථාන මාරුව අනුමත කළ නොහැකි බවත් දක්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු හා නිරීක්ෂණ :-**

පැමිණිලිකරු වසර 22 ක් පශු වෛද්‍ය පර්යේෂණ ආයතනයේ පර්යේෂණ සහකාරවරයෙකු ලෙස සේවය කර 2014.05.02 දින සිට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සත්ත්ව පාලන නිලධාරියෙකු ලෙස පත්වී ඇති අතර. පැමිණිලිකරු සමඟ සත්ත්ව පාලන නිලධාරීන් ලෙස පත්වීම් භාරගත් (සීමිත බඳවා ගැනීම් යටතේ) නිලධාරීන් 09 දෙනකු අතරින් 07 දෙනකු සඳහාම පහසු සේවා ස්ථාන ලබා දී ඇති අතර. පැමිණිලිකරු සමඟ සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලය සඳහා දෙදෙනකු පත්කර ඇති බව නිරීක්ෂණය වේ.

එසේම 2014.05.02 විවෘත බඳවා ගැනීම් යටතේ පත්වීම් ලබා දී ඇති සත්ත්ව පාලන නිලධාරීන් 08 දෙනකු අතරින් 06 දෙනකු සඳහාම ස්ථාන මාරු ලබා දී ඇති අතර. ඉදිරි දෙදෙනාද සේවය කළ ස්ථාන වලින් නිදහස් කර ඇත.

පැමිණිලිකරු මහනුවර ප්‍රදේශයේ පදිංචිව සිටින අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයට පත්කිරීම හේතුවෙන් නිවසේ සිට සේවා ස්ථානයට කි.මී 185 ක පමණ දුරක් තිබීමත් අසනීප තත්වයන් හා පවුලේ සාමාජිකයන්ගේ ආරක්ෂාව හා පෞද්ගලික දුෂ්කරතා හේතුවෙන් 2017.01.19 දිනැතිව අභ්‍යන්තර ස්ථානමාරුවක් ප්‍රධාන කාර්යාලයට හෝ කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලයට ලබා දෙන ලෙස හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත කරන ලද ඉල්ලීමක් අනුව අදාළ ස්ථාන මාරුව ලබා දීම අනුමත කර අවශ්‍ය කටයුතු සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) වෙත යොමුකර ඇති බවද නිරීක්ෂණය වේ.

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) විසින් අදාළ ස්ථාන මාරු ලිපිය හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයා (වැ.බ) විශ්‍රාම යනතෙක් ඔහුට ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති අතර. ඉන් පසු පැමිණිලිකරු විසින් අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) මුණගැසීමෙන් පසු අදාළ ස්ථාන මාරුව ලබාදීම ප්‍රතික්ෂේප කර ඇති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු හා එම්.එස්.ජී අයන්ති ගුණරත්න යන අයවලුන් විසින් 2017 වර්ෂය සඳහා වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය සලකා බලා ඇති මාරු මණ්ඩලය ඔවුන් දෙදෙනා සුදුසු අනුප්‍රාප්තිකයෙකු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ස්ථාන මාරු නිර්දේශ කර නොමැති නමුත්, එම්.එස්.ජී අයන්ති ගුණරත්න යන අයට අනුප්‍රාප්තිකයෙකු පසුව ලබා දීමේ පදනම මත 2017 ජනවාරි මස සිට ස්ථාන මාරුව කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලය සඳහා ලබා දී ඇත.

පැමිණිලිකරු විසින් උතුරු මැද සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ත්ව පාලන නිලධාරියෙකු අනුප්‍රාප්තිකයෙකු ලෙස පැමිණිලිකරුගේ රාජකාරී ආවරණය කරන බවට වූ ලිපියක් සහිතව නැවත අභියාචනයක් ඉදිරිපත් කර ඇති නමුත් අදාළ ස්ථාන මාරුව මේ දක්වා ලබා දීමට කටයුතු කර නොමැති අතර 2017.05.17 දිනැතිව වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පැමිණිලිකරු ඇතුළු ස්ථාන මාරු ඉල්ලා ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරු පිළිබඳව අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) වෙත යොමුගත ලිපිය මගින් පැමිණිලිකරු සම්බන්ධයෙන් ස්ථාන මාරු කමිටුවේ නිර්දේශය ලෙස දන්වා ඇත්තේ මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති පැමිණිල්ලේ කටයුතු අවසන් වන තෙක් ස්ථාන මාරු ලබා දීම පිළිබ ඳ නිර්දේශ කළ නොහැකි බවයි.

නිගමනය :-

මෙකී කරුණු අනුව පැමිණිලිකරුගේ ස්ථාන මාරුව සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී ස්ථාන මාරුව ලබා දීමට අවශ්‍ය සියළු කොන්දේසි සපුරා තිබියදී පැමිණිලිකරුට අදාළ ස්ථාන මාරුව ලබා නොදීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති වෙනස්කමකට භාජනය නොවීමේ අයිතිය වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව,

01. වහාම ක්‍රියාත්මක වන පරිදි පැමිණිලිකරුට ස්ථාන මාරුව ලබා දීමට පියවර ගත යුතුය.

02. වගඋත්තරකාර පාර්ශවය සම්බන්ධයෙන් නිසි විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙහි පිටපතක් ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යංශයේ ලේකම් වෙත යොමු කරනු ලැබේ.

2019.02.28 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- ලේකම්.
ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය.
නො : 497. ආර් ඒ ද මැල් මාවත.
කොළඹ 03.

B/